# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01//චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இல / Your No: ........................................ | දිනය / திகதி / Date: 2021.04.11 |

**සමෘද්ධි ප්‍රජා මූල බැංකු චක්‍රලේඛ :- 2021/09**

සියළුම විධායක කමිටු/ පාලක මණ්ඩල සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජා මූල බැංකු/ බැංකු සමිති කළමණාකරුවන් ,

**<u>කොවිඩ්- 19 ව්‍යවසනකාරි තත්ත්වය නිසා බලපෑමට ලක් වූ පවුල්වලට රු. 5000/- ක දීමනාවක් ගෙවීම</u>**

01. අග්‍රාමාත්‍ය ලේකම් විසින් නිකුත් කරන ලද PTF/03-2021 දරණ 2021.04.10 දිනැති චක්‍රලේඛය මගින්, ලිපියේ සඳහන් පරිදි පවුල් කාණ්ඩ 07 සඳහා පමණක් රු. 5000/- ක දීමනාව ගෙවීම සඳහා පහත උපදෙස් පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

02. දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය අරමුදල් සමෘද්ධි බැංකු විසින් මහජන/ලංකා බැංකුවල පවත්වාගෙන යන ජංගම ගිණුමට අරමුදල් ලබාදෙන අතර ඒම මුදල් ලැබීම පහත පරිදි ගිණුම් ගත කල යුතුය.

| | |
|---|---|
| ජංගම ගිණුම | - හර |
| අඩු ආදායම්ලාභින් පවුල් සඳහා ගෙවිය යුතු සමාජ ප්‍රතිලාභ දීමනා ගිණුම | - බැර (ලේජර අංක 4056) |

03. අග්‍රාමාත්‍ය ලේකම්ගේ ඉහත චක්‍රලේඛය අනුව පවුල් කාණ්ඩ 07 කට අනුව සුදුසුකම්ලත් ප්‍රතිලාභින් වෙත ගොස් මුදල් ලබාදීම කල යුතුය. ඒ අනුව වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරින් සඳහා පහත පරිදි මුදල් නිදහස් කල යුතුය.

| | |
|---|---|
| අඩු ආදායම්ලාභින් පවුල් සඳහා ගෙවිය යුතු සමාජ ප්‍රතිලාභ දීමනා ගිණුම | - හර |
| මුදල් ගිණුම | - බැර |


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

ඒ සඳහා මුදල් හර සහ බැර සමඟ පොදු 35 ආකෘතිය භාවිතා කළ යුතුය.

04. වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරියා විසින් ග්‍රාමීය කමිටුවේ සාමාජිකයකු හෝ සමෘද්ධි ප්‍රජාමූල සමිති නිලධාරියෙකුගේ සහභාගිත්වය මත පොදු 36 ආකෘතිය හෝ සකස් කල ලේඛනයක් මඟින් ප්‍රතිලාභින්ට දීමනාව ගෙවා අත්සන් ලබාගත යුතුය.

05. සමෘද්ධි සංවර්ධන නිලධාරින් වැඩ බලන වසම්වල වැඩ බලන නිලධාරියා හරහා ප්‍රතිලාභ ගෙවීම සිදු කරන ලෙසත් ඒසේ කිරිමට අපොහොසත් වන විට දී හෝ යම් වසමක ගෙවීම් කිරීමට නිලධාරින් ඉදිරිපත් නොවන විටක දී සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩල / කලාප සහකාර/ බැංකු සමිති නිලධාරියෙකු හට රාජකාරි පවරා අදාල කාර්යය සිදු කර ගත යුතුය. ඒ සඳහා සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ නිලධාරියෙකුගේ සහාය ලබාගත හැකිය.

06. ලංකා/මහජන බැංකුවේ සිට සමෘද්ධි බැංකුව වෙත මුදල් ගෙන ඒමේදී හා ඒම මුදල් බැංකුව තුලදී ආරක්ෂාව සඳහා උපරිම රු. මිලියන 10 දක්වා ද වසම වෙත මුදල් රැගෙනයාම සඳහා උපරිම ලක්ෂ 10 ක අතරැදි මුදල් සීමාව ලබාදීමට කටයුතු කර ඇත. තවද මෙම සීමාව තුල රැගෙන ඒන මුදල් ප්‍රමාණවත්වත් නොවන විටක වරින් වර මුදල් රැගෙන ඒමට සහ රැගෙනයාමට හැකිය.

07. මෙම වැඩසටහන යටතේ දීමනාව ගෙවීම් කිරිමට බැංකුවට ලැබී ඇති මුදල ප්‍රමාණවත් නොවන විටක සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් මුදල් ඉදිරියේදී ලබාගැනීමේ පදනම මත සමෘද්ධි බැංකුව සතු භාවිතයට ගත හැකි අරමුදල් භාවිතා කල හැකි අතර, ඒ සඳහා ගිණුම් සටහන පහත වේ.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපූර්ණය කරගත යුතු
අඩු ආදායම්ලාභීන්ට ගෙවන ලද සමාජ ප්‍රතිලාභ දීමනා ගිණුම - හර (කේත අංකය 3319)
මුදල් ගිණුම - බැර

08. ඉහත සඳහන් ගෙවීම් පිළිබඳව සමෘද්ධි බැංකු පාලක මණ්ඩලය දැනුවත් කරන ලෙස ද දන්වමි. ඉන් අනතුරුව එලෙස ගෙවන ලද මුදල් ප්‍රමාණය පිළිබඳ විස්තරයක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට කඩිනමින් දන්වා ඒම මුදල ප්‍රතිපූර්ණය කරගත යුතුය.

09. රු. 5000/- දීමනාව ගෙවීම් සඳහා ඉදිරි රජයේ නිවාඩු දිනවලදී සමෘද්ධි බැංකුව විවෘත කරන ලෙස දන්වන අතර, ඉටු කරන රාජකාරි සඳහා නිවාඩු දින වැටුප් ඇතුලු දීමනා ලබාගැනීමට හැකි බවත් කාරුණිකව දන්වමි.

10. දීමනා ගෙවීම් කිරිමේදී මුදල්වල ආරක්ෂාව සඳහා පොලිස් ආරක්ෂාව ලබාගැනීමට කටයුතු කරන ලෙසත්, ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභින්ගේ ජංගම දුරකථන අංකය ගෙවීම් ලේඛණයේ පැහැදිලිව සටහන් කර ගත යුතු බව ද වැඩිදුරටත් සඳහන් කරමි.

11. මෙම සමාජ ප්‍රතිලාභ ගෙවීම් සිදු කර ඇමුණුම 01 හි සඳහන් ආකෘතිය අනුව තොරතුරු සකස් කර 2021.04.20 දිනට පෙර දිස්ත්‍රික් සමෘද්ධි අංශයට යොමු කල යුතු අතර, දිස්ත්‍රික් සමෘද්ධි අංශය විසින් සියලු තොරතුරු රැස් කර bank@samurdhi.gov.lk විද්‍යුත් ලිපිනය හරහා කඩිනමින් ප්‍රජාමූල බැංකු අංශය වෙත ඒවීමට කටයුතු කරන ලෙස දන්වමි. මීට අමතරව ආර්ථික පුනර්ජීවන හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය ලබාදුන් ආකෘති පත්‍ර අනුව ද ප්‍රගතිය වාර්තා කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ද සඳහන් කරමි.

12. කොවිඩ්-19 ව්‍යවසන තත්ත්වයන් තුල දී සමාජ ප්‍රතිලාභ ගෙවීමේදී ඔබ හා බැංකු කාර්ය මණ්ඩලයේ ද ක්ෂේත්‍රගත නිලධාරින් දැක්වූ උනන්දුව සහ කැපවීම මෙම වැඩසටහන සඳහා ද නොමසුරුව ලබාදෙනු ඇතැයි හුදෙක් බලාපොරොත්තුවෙමි.

13. මෙම කටයුතු කිරීමේදී මහජන සෞඛ්‍ය පරීක්ෂක ඇතුළු සෞඛ්‍ය අංශ මඟින් ලබාදෙන උපදෙස් නිරතුරුව පිළිපැදීම ඔබ සියලුදෙනා සතු වගකීමක් බව ද වැඩිදුරටත් සඳහන් කරමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ජනාධිපති ලේකම් - කා.දැ.ස.
2. අග්‍රාමාත්‍ය ලේකම් - කා.දැ.ස.
3. අමාත්‍ය මණ්ඩල ලේකම් - කා.දැ.ස.
4. විගණකාධිපති - කා.දැ.ස.
5. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කා.දැ.ස.
6. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ස.
7. ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ස.
8. අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්, සම ලේකම්, ආර්ථික පුනර්ජීවන හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය - කා.දැ.ස.
9. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස / අ.ක.ස.
10. දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක..ස.
11. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
12. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, - අ.ක.ස.
13. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
14. දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, - අ.ක.ස.